ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - IV වන මට්ටම

දෙවන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - 2023/2024

ගිවිසුම් නීතිය – LLU4607

කාලය : පැය එකයි (01) යි

දිනය: 2024.12.13 වේලාව : ප.ව.01.30 - ප.ව.02.30

මුළු ප්‍රශ්න ගණන - දෙකයි 02

ප්‍රශ්න එකකට (01) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. i. දේශීය ව්‍යවසායිකාවක් වන අමායා විසින් ඉදිකිරීම් සමාගමක් වන බ්‍රයිට් බිල්ඩ් පුද්ගලික සමාගම (BrightBuild Pvt Ltd) සමඟ තම කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම උදෙසා ගිවිසුමකට එළැඹුණාය. බ්‍රයිට් බිල්ඩ් පුද්ගලික සමාගමේ කළමනාකරු වන නිමල් විසින් අමායාට, සාකච්ඡාව අතරතුරදී සහතික වූයේ මාස දෙකක් ඇතුළත එහි අලුත්වැඩියා කටයුතු සම්පූර්ණ කරන බවටයි. මෙම එකඟතාව වාචිකව ඇතිවූ අතර මෙය පසුව අත්සන් කරන ලද ලිඛිත ගිවිසුමෙහි සඳහන් වූයේ නැත. එම සාකච්ඡාවේදී නිමල් විසින් තම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වසර 15ක අත්දැකීම් ද ඉස්මතු කළ අතර එමගින් ඔහුගේ පොරොන්දු විශ්වාස කළ හැකි බවට අමායාට සහතික කළේය. මෙම ගිවිසුම පසුව ලිඛිත බවට පත්කරන ලදී. මෙම ලිඛිත ගිවිසුමෙහි බ්‍රයිට් බිල්ඩ් පුද්ගලික සමාගම විසින් උසස් තත්ත්වයේ අමුද්‍රව්‍ය භාවිතා කරන බවටත් සියලුම දේශීය රෙගුලාසි වලට අනුකූල වන බවටත් සඳහන් වී ඇත. කෙසේ වෙතත්, එහි මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා නියමිත කාලසීමාවක් සඳහන් කර නැත. මෙම ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව, අමායා සොයා ගන්නා ලද්දේ බ්‍රයිට් බිල්ඩ් පුද්ගලික සමාගම විසින් ඉදිකිරීම් සඳහා ප්‍රමිතියෙන් තොර අමුද්‍රව්‍ය භාවිතා කිරීමට පටන් ගෙන ඇති බවයි. ඊට අමතරව, ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය මාස හතරක් දක්වා දිගු වූ අතර, එමගින් ඇගේ ව්‍යාපාරික කටයුතු සැලකිය යුතු අන්දමට කඩාකප්පල් විය.

අමායා මෙම ගිවිසුම අවසන් කිරීමටත්, ප්‍රමාදය සහ ප්‍රමිතියෙන් තොර අමුද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් අලාභ ඉල්ලා සිටීමටත් බලාපොරොත්තු වෙයි.
අමායාට උපදෙස් දෙන්න.

(ලකුණු 15)

ii ගිවිසුමක නියමයන් නිර්වචනය කිරීම සඳහා *Hong Kong Fir Shipping Co. Ltd Vs. Kawasaki Kisen Kaisha Ltd* (1962) 2QB 26, (1962) 1 ER 474 නඩු තීන්දුවෙහි වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

2. නීත්‍යානුකූල ගිවිසුමක් නිර්මාණය කිරීමේදී අගනා ප්‍රතිශ්‍රය සහ සාධාරණ හේතුව යන සංකල්පයන්හි විෂය පථය සහ යෙදීම පිළිබඳව සටහනක් සකස් කරන්න. ඔබේ පිළිතුරට මෙම සංකල්ප අතර වෙනස්කම් පිළිබඳ සාකච්ඡා කිරීමක් ද ඇතුළත් විය යුතුය.

(ලකුණු 20)

***සියළුම හිමිකම් ඇවිරිණි***